සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

1049

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2018**
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | කාලය / காலம் / Time | පැය 02යි. |
|---|---|---|---|---|---|---|---|

නම:-........................................................ විභාග අංකයඃ-........................................................

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. දෙවියන් වහන්සේ විසින් විවිධ ගව මහීෂයන් ද, උරගයින් ද වන මුර්ගයන් පොළොවෙන් ම නිපදවන ලද්දේ කී වැනි දිනයේදී ද?
   1. තුන්වැනි දිනයේ ය.
   2. පස්වැනි දිනයේ ය.
   3. හයවැනි දිනයේ ය.
   4. දෙවැනි දිනයේ ය.

02. ගුවන් තලය එතුමන්ගේ .................... විදහා පාන්නේය. (ගීතාවලිය 19:1)
   1. මහිමය.
   2. මනහර බව
   3. අත්කම්
   4. බලය

03. "දිවැසිවරයා මෙය කියන්නේ කවරෙකු ගැන ද?" මෙය පවසන ලද්දේ කවුරුන් විසින් කා හට ද?
   1. සාවුල් විසින් ජේසුස් වහන්සේට
   2. සෙනඟ විසින් ස්නාවක ජොහාන්ට
   3. පරිසිවරයෙක් විසින් අයකැමියෙක්ට
   4. එතියෝපීය නපුංසකයා විසින් පිලිප්ට

04. මීරියම් තුළ දැකිය හැකි යහපත් ගුණාංග අයත් කාණ්ඩය වන්නේ,
   1. වැයවීම, කෲර බව
   2. අලසකම, සහෝදර ප්‍රේමය
   3. ධෛර්යය, වැයවීම
   4. ආත්මාර්ථය, ආඩම්බරය

05. සොහොන් ගෙය ලඟට දිව ගොස් නැමී බලා හණරෙදි පමණක් දැක පුදුමය හා විශ්වාසය ගොඩනැගුනේ,
   1. මරියා ය.
   2. තෝමස් තුමා ය.
   3. ක්ලේයොපස් ය.
   4. සීමොන් පේදුරුතුමා ය.

06. යහපත් සමාරිතයාගේ උපමාවෙන් ආදර්ශය ලබන කිතුණු අපි,
   1. උදව් බලාපොරොත්තුවෙන් තොරව උදව්ව අවශ්‍ය අයට පිහිට වෙමු.
   2. සම්පත් ස්වල්ප නිසා අපගේ අවශ්‍යතා වලට ම තබා ගනිමු.
   3. උස් පහත් භේද සලකා සැම විටම ක්‍රියාකිරීමට යොමු වෙමු.
   4. ප්‍රේමය සීමාසහිතව අප කැමති අයට ලබා දීමට සිතා ගනිමු.

07. 'සාමුවෙල්' යන නමෙහි අරුත
   1. දෙවියන් වහන්සේ අප සමඟය.
   2. දෙවියන් වහන්සේගෙන් ඉල්ලා ගත්.
   3. දෙවියන් වහන්සේ අපගේ ශක්තියයි.
   4. දෙවියන් වහන්සේගේ ත්‍යාගය

08. "මිසර දේශයෙහි පදිංචිව වහල් කමට පත් වූ ඉශ්‍රායෙල් ජනතාව නිදහස කරා ගිය ගමනේ" විස්තරය බයිබලයේ සඳහන් වන පොත වන්නේ,

1. උත්පත්තිය  2. ජොහාන්
3. නික්මයාම  4. ලෙවී ව්‍යවස්ථාව

09. ජේසුස් වහන්සේ පිළිබඳ ගාබ්‍රියෙල් දේවදූතයා හා එඬේරුන් පැවසූ දේ ගැන මරිය තුමිය,

1. ඉතා බියපත්ව නාසරෙත්ට නුවරට යෑමට සිතුවාය.
2. සියල්ල සිත්හි නිදන් කොට මෙනෙහි කළාය.
3. සුවිශේෂී දරු උපත ගැන ආඩම්බර විය.
4. අයහපතින් මුදවා ගැනීමට වැඩි කුමරු ගැන උදම් විය.

10. දිය .... පොළොවෙන් ඉහළ ඇදගෙන .... මඟින් වැසි වස්වන්නේ දෙවිදාණෝය. හිස්තැනට සුදුසු ම වචන වන්නේ,

1. දහරා, වළාකුළු  2. වැල්, වාෂ්ප
3. කඩිති, වැසි බිඳු  4. බිංදු, වාෂ්ප

11. "නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේට පමණක් සේවය කරන්නැ"යි ජේසුස්වහන්සේ පිළිතුරු දුන්නේ කීවැනි පරීක්ෂාවේ දී ද?

1. තුන්වැනි පරීක්ෂාවේ දී ය.  2. දෙවැනි පරීක්ෂාවේ දී ය.
3. පළමු පරීක්ෂාවේ දී ය.  4. ඉහත එක් අවස්ථාවක්වත් නොවේ.

12. 'නැති වුණු පුත්‍රයා' පිළිබඳ උපමාව මඟින් කිතුණු අපට උගන්වන පාඩමක් <u>නොවන්නේ,</u>

1. අනුන් විනිශ්චය යි.  2. කොන්දේසි රහිත කමාවයි.
3. වැරදි නොකිරීමයි  4. පසුතැවිල්ල තුළ ජීවිත වෙනසයි.

13. ජෙරිකෝවේ සිටි බර්තිමේයස් ජේසුස් වහන්සේගෙන් කුමක් ඉල්ලුවේ ද?

1. "සමිදාණෙනි, මට සුවය දුන මැනව"
2. "කමා වන්න, ජේසුනි මා හට"
3. "ගුරු දේවයෙනි, මට පෙනීම දුන මැනව"
4. "ජේසුස් වහන්ස, මා පවිත්‍ර කරන්න ඔබට හැකිය."

14. ජේසුස් වහන්සේගේ මරණයට පෙර "දේව මාලිගය කඩා දමා එය තුන් දවසකින් ගොඩ නගන ඔබ, ඔබම ගලවා ගන්න" මෙය නිගා කරමින් පැවසුවේ කවුද?

1. මුර සෙබළුන් ය.  2. ප්‍රජා මූලිකයින් ය.
3. විනයධරයින් ය.  4. මඟ යන්නෝ ය.

15. ජේසුස් වහන්සේ ගලීලය මැදින් ගමන් කර ගමට ඇතුළු වූ කළ ලාදුරු රෝගීන් කී දෙනෙක් පැමිණියේ ද?

1. දස දෙනෙකි.  2. එක් කෙනෙකි.
3. දොළොස් දෙනෙකි.  4. හත් දෙනෙකි.

16. පරිසියා හා අයකැමියා උපමාවේ අයකැමියා මෙන් අප කළ යුතු දේ වන්නේ,

1. සතියට දෙවරක් නිරාහාරව සිටීම.
2. පසුතැවීමෙන් තමා ව පහත් කිරීම.
3. තමාගේ ධර්මිෂ්ඨකම ප්‍රකාශ කිරීම.
4. අන් අය හෙළා දැකීම.

17. 'ඇසට ඇස, දතට දත' යන්න ජුදෙව් සමාජයේ ප්‍රචලිතව පැවතුන ක්‍රියාවලියකි. ඉන් පෙන්වන ගුණාංගය වන්නේ,

1. ඉවසීම
2. පළි ගැනීම
3. ආඩම්බරකම
4. ධර්මිෂ්ඨකම

18. ගොලියත් ට එරෙහිව අභියෝග භාරගත් දාවිත් එම අවස්ථාවේ,

1. රාජ ඇඳුම් කට්ටලය හා පළඳනාය රැගෙන යාම.
2. කඩුව හා හෙල්ලය රැගෙන යාම.
3. සැරයටිය, ගල්පටිය, ගල් පහක් රැගෙන යාම.
4. මල්ලක් හා සැරයටිය රැගෙන යාම.

19. අපට දොස් නගන පන්තියේ යහළුවෙකු ට අප සැලකිය යුත්තේ,

1. අප ද දොස් නගමිනි.
2. දෙමාපියන් දන්වා බැනීමෙනි.
3. කථා නොකරම සිටීමෙනි.
4. දොස් අමතක කර කමා වීමෙනි.

20. අනාවරණ සාහිත්‍යට අයත් බයිබලයේ පොතකි.

1. විරාවලිය
2. දානියෙල්
3. ක්‍රියා පොත
4. ලූක් පොත

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

**පළමු ප්‍රශ්නය හා තව ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01. (1) ස්ත්‍රීය ද හා පුරුෂ ද වශයෙන් ඔවුන් මවනු ලැබුවේ කී වැනි දිනයේ දී ද?

(2) ජේසුස් වහන්සේගේ බවතීස්ම ස්නාපනයෙන් අවධාරණය වන කරුණු 2 ක් දක්වන්න.

(3) "විපුල ප්‍රසාද ලත් උත්තමීය ඔබට මංගල වේ" මෙ වදන් කා විසින් කා හට පවසන ලද්දක් ද?

(4) දෙවියන් වහන්සේගේ කැමැත්තට පිටු පා ක්‍රියා කිරීම හඳුන්වන්නේ කුමන නමකින් ද?

(5) සතියේ පළමු වැනි දා එළිවෙන මොහොතේ කාන්තාවන් සොහොන වෙත ගියේ කුමක් සඳහා ද?

(6) අවුරුදු දොළහේ ජුදෙව් පිරිමි දරුවනට හිමි වූ වරප්‍රසාද 2 ක් දක්වන්න.

(7) නැති වුණු පුත්‍රයාගේ උපමාවේ පුත්‍රයා පියා වෙත පැමිණ කුමක් කීවේ ද?

(8) මිනිසා හා මිනිසා අතර සම්බන්ධතාව කෙසේ විය යුතු දැයි පෙන්වන දස පනතට අයත් පණත් 02ක් දක්වන්න.

(9) ජෙස්සේ ගේ පුතුන් ගණන හා ඔහු විසූ නුවර දක්වන්න.

(10) කපාලපිටිය යන්නෙහි අරුත කුමක් ද? (ලකුණු 02 × 10 = 20)

02. (1) ගාබ්‍රියෙල් දේවදූතයා බිළිඳු ජේසුගේ උපත පිළිබඳ හඳුනා ගැනීමට දුන් ලකුණ කුමක් ද? (ල. 02)

(2) ජේසුස් වහන්සේ හැදුණු වැඩුණු ආකාරය පෙන්වන බයිබල් පදයක් ලියන්න. (ල. 03)

(3) දොළොස්වියේ ජේසුස් වහන්සේ මෙන් අපට දේව පියා සමඟ ක්‍රියා කළ හැකි ආකාර 3ක් විස්තර කරන්න. (ල. 05)

03. (1) පාළුකරයේදී ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා අතුරින් තුන්වන පරීක්ෂාව හා එතුමා දුන් පිළිතුර ලියන්න. (ල. 02)

(2) ජේසුස් වහන්සේ දුන් පිළිතුරෙන් අපට උගත හැකි පාඩම ලියන්න. (ල. 03)

(3) ඔබට පැමිණි පරීක්ෂාවක් හා ඉන් මිදුන අන්දම විස්තර කරන්න. (ල. 05)

04. (1) මෝසෙස්ගේ දෙමව්පියන්ගේ නම් දක්වන්න. (ල. 02)

(2) මීරියම් තම සහෝදරයා වෙනුවෙන් කැප වූ අයුරු කෙටියෙන් දක්වන්න. (ල. 03)

(3) ඔබ අයත් පවුල තුළ කැපවීමෙන් ඔබට කළ හැකි ක්‍රියාවන් තුනක් විස්තර කරන්න. (ල. 05)

05. (1) එදා ජුදෙව් සමාජයේ ප්‍රතික්ෂේප වූ ජන කණ්ඩායම් 2ක් නම් කරන්න. (ල. 02)

(2) තමා උසස් කරගන්නා පරිසියාගේ යැදුමෙහි අඩංගු කරුණු 3 ක් ලියන්න. (ල. 03)

(3) නිහතමානිව නිවසේදී පාසලේ දී සමාජයේ දී කටයුතු කිරීමට අවශ්‍ය ශක්තිය ඉල්ලා කරන යාච්ඤාවක් ලියන්න. (ල. 05)

06. (1) මහ සිකුරාදා දින කිතුණු අප සිහිපත් කරන සිදුවීම කුමක් ද? (ල. 02)

(2) 'ඒලී, ඒලී ළමා සබක්තානි' යන්නෙහි අරුත කුමක් ද? (ල. 03)

(3) ජේසුස් වහන්සේ කුරුසිපත් වීමෙන් පසු උත්ථානයෙන් අපගේ ජීවිතවලට ලද බලාපොරොත්තු 3 ක් විස්තර කරන්න. (ල. 05)

07. පහත දක්වෙන මාතෘකා වලින් 02ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(1) කුරුසි පාමුල සිටි මග්දලායේ මරියා මම ය.

(2) මරිය තුමිය හා ජෝසෙප් තුමා

(3) යාච්ඤාව කිතුණු අප සතු ප්‍රබල අවියකි.

(4) බයිබලයේ ග්‍රන්ථ සැකසුම (2 × 5 = ල. 10)